සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S I

නම: ............................................ | ඉතිහාසය | කාලය පැය එකයි

උපදෙස් :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01) මහාවංශයේ අර්ථ විවරණය සඳහා සම්පාදිත ටීකාව මින් කුමක්ද?
i) දීපවංශය ii) උත්තරවිහාරට්ඨ කථා iii) වංසත්ථප්පකාසිනි iv) විනයට්ඨ කථා

02) පොළොන්නරු රාජ්‍ය සමයේ භාවිතා කරන ලද කාසි විශේෂය මින් කුමක්ද?
i) රන් කහවණුව ii) රිදී මස්ස iii) ලක්ෂ්මී කාසිය iv) තඹ මස්ස

03) ශ්‍රී ලංකා ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තව පැවති වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථානයක් වන්නේ,
i) බෙල්ලන්බැඳිපැලැස්ස ය. ii) දියවින්න ය.
iii) පොතාන ය. iv) මිනිහාගල්කන්ද ය.

04) " පවුල" යන අදහස දීමට පැරණි කාලයේ භාවිතා වූයේ,
i) කුල යන පදයයි. ii) ගෘහපති යන පදයයි.
iii) ගමික යන පදයයි. iv) කුඩීන් යන පදයයි.

05) වර්තමානයේ අපේ රටේ පාර්ලිමේන්තුව මඟින් ඉටුකරනු ලබන කාර්යය පැරණි කාලයේ ඉටු කරන ලද්දේ,
i) සභාව මඟිනි. ii) රාජ සභාව මඟිනි. iii) විධායකය මඟිනි. iv) මහලේ මඟිනි.

06) පැරණි වාරිකර්මාන්තයට අදාල නොවූ අංගයක් වන්නේ,
i) බිසෝකොටුව ය. ii) පිටවාන ය. iii) හතරැස් කොටුව ය. iv) රළපනාව ය.

07) පැරණි ගමක ජීවත්වූ දිළිඳු වැසියෙකු ඊළඟ කන්නයේදී නැවත ආපසු දෙන පොරොන්දුව මත ඒ ගමේ විසූ ගමිකයාගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගැනීම පිළිබඳව පුවතක් සඳහන් මූලාශ්‍රය,
i) සමන්තපාසාදිකාව යි. ii) ජාතකකට්ඨකතාව යි.
iii) සද්ධර්මාලංකාරය යි. iv) සහස්සවත්ථුප්පකරණය යි.

08) ඇළ මාර්ගවලින් මත්ස්‍යයින් ඇල්ලීම වෙනුවෙන් රජය අයකළ බද්ද හැඳින්වූයේ,
i) දකපති නමිනි. ii) බොජකපති නමිනි. iii) මතරමජිබක නමිනි. iv) ගෘහදණ්ඩ නමිනි.

09) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පරුමක පිළිබඳ කියවෙන සත්‍ය ප්‍රකාශය තෝරන්න.
i) වැව්ගම් පද්ධතියක් භාරව කටයුතු කිරීම. ii) ගමට අයත් වැව නඩත්තු කිරීම.
iii) ගම්වල පැවති ආරවුල් විසඳීම. iv) වැවේ ජලය බෙදාහැරීම.

10) පාරම්පරිකව දාසකම් කළ අය ඓතිහාසික සමාජය තුළ හැඳින්වූයේ,
i) ධනක්කීතදාස යනුවෙනි. ii) මෛකාප්පර් යනුවෙනි.
iii) රද්කෝල් සම්දරු යනුවෙනි. iv) අන්වයාතදාස යනුවෙනි.

11) අතීතයේදී හේන හැඳින්වීම සඳහා භාවිතා කරන ලද නාමයන් පමණක් අයත් කාණ්ඩය තෝරන්න.
i) පිටබිම්, සෙහෙන්, සේන් ii) සෙහෙන්, කනත්ත, පැල
iii) කනත්ත, කෙත, සෙහෙන් iv) පිටබිම්, කෙත, සෙහෙන්

12) අන්තර්ජාතික වෙළෙඳාම නැගෙනහිර ඉන්දියානු සාගර කලාපයට මාරුවීම නිසා ආරම්භ වූ රාජධානිය,
i) අනුරාධපුරය යි. ii) දඹදෙණිය යි. iii) පොළොන්නරුව යි. iv) කුරුණෑගල යි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

13) " රන් දෙව්සි කළඳ" යනුවෙන් සඳහන් රන් ලෝහ කැබැල්ලක් සොයාගත් ඓතිහාසික ස්ථානය,
i) ජේතවනාරාමය යි. ii) අභයගිරිය යි. iii) වෙස්සගිරිය යි. iv) සීගිරිය යි.

14) පැරණි කාලයේ දිග මැනීමට භාවිතා කරන ලද මිම් ඇතුළත් වරණය තෝරන්න.
i) ආංගුලය, වියත, ගුන්ජා, මාසක
ii) අංගුලය, ගව්ව, පරමාණු, ධරණ
iii) කිරිය, හවජර, මාසක, ගුන්ජා
iv) ගව්ව, යොදුන, වියත, ආංගුලය

15) මූලාශ්‍රගත තොරතුරුවලට සඳහන් " පණ්ණසාලා" යනු,
i) භික්ෂූන් වහන්සේලාගේ භාවනා කුටි ය.
ii) භික්ෂූන් වහන්සේලාගේ ධර්ම දේශනා කළ ස්ථානයන් ය.
iii) භික්ෂූන් වහන්සේලාට වාසය කිරීමට සැදූ වරිච්චි නිවාස ය.
iv) භික්ෂූන් වහන්සේලා දානය ලබාගත් ශාලා ය.

16) අතීත වාස්තු විද්‍යාත්මක නිර්මාණවලදී අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවට හොඳම නිදසුන වන්නේ,
i) ආලාහන පිරිවෙන යි.
ii) ඉසුරුමුණි විහාරය යි.
iii) රන්මසු උයන යි.
iv) ගල් විහාරය යි.

- පහත වගුවේ දී ඇති තොරතුරු ඇසුරෙන් 17 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - උළුකැඳ | C - ඇඹුල් කැඳ | E - කාඩි ඇඹුල |
| B - කොළ කැඳ | D - දිය කැඳ | F - යවාගු |

17) වර්තමානයේ ලුණු කැඳ යනුවෙන් හඳුන්වනු ලබන අතීතයේ රෝගීන්ට දීම සඳහා පිළියෙල කළ කැඳ හැඳින්වීමට භාවිතා කෙරුණු නම් ඇතුළත් පිළිතුර වන්නේ,
i) ADF ii) BDF iii) ACE iv) BCE

18) පැරණි නගර පරිහානියට හේතුවක් වූයේ,
i) සිහසුනට උරුමක්කරුවන් නැතිවීම ය.
ii) ජෝතිය සිටුවරයාගේ කැරැල්ල ය.
iii) වෙළෙඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම ය.
iv) යුරෝපීය ජාතිකයන් පාලන කටයුතු වලට සම්බන්ධවීම ය.

19) ගම්පොළ සමයේදී රාජ්‍ය උරුම වූ නව ක්‍රමවේදයක් වන්නේ,
i) පියාගෙන් පුතුට රාජ්‍යය උරුමවීම යි.
ii) සහෝදරයගෙන් සහෝදරයාට රාජ්‍යය උරුම වීම යි.
iii) රජුගේ බිසවගේ සහෝදරයාට රාජ්‍ය උරුමවීම යි.
iv) මව් පාර්ශවයෙන් රාජ්‍ය උරුම වීම යි.

20) යාපනය රාජධානිය සම්බන්ධව නැවැරදි ප්‍රකාශය කුමක්ද?
i) යාපනය රාජධානියට ස්වභාවික රැකවරණයක් පැවතිණි.
ii) විජය කුලංකෙ ආර්ය චක්‍රවර්තී යාපනයේ ආරම්භක පාලකයා ය.
iii) කාලිංගරායර නම් සෙන්පතියෙක් යාපනය ආක්‍රමණය කිරීම.
iv) යාපනයට නිත්‍ය හමුදාවක් සිටීම.

21) ලංකාවට පැමිණි පෘතුගීසීන් ප්‍රථමයෙන්ම සබඳතා ගොඩනගා ගන්නා ලද්දේ,
i) උඩරට රාජධානිය සමඟ ය.
ii) කෝට්ටේ රාජධානිය සමඟ ය.
iii) යාපනය රාජධානිය සමඟ ය.
iv) සීතාවක රාජධානිය සමඟ ය.

22) පෘතුගීසින් ආසියාවට පැමිණෙන විට ආසියාවේ වෙළෙඳ ඒකාධිකාරය රඳවාගෙන සිටි ජාතිකයින් වන්නේ,
i) ලන්දේසි ජාතිකයන් ය.
ii) ප්‍රංශ ජාතිකයන් ය.
iii) මුස්ලිම් ජාතිකයන් ය.
iv) ඉංග්‍රීසි ජාතිකයන් ය.

23) අධිකාරම්වරුන්ගේ ආඥා පණිවිඩ ප්‍රාදේශීය මට්ටමට රැගෙන ගිය නිලධාරීන් සමූහය හඳුන්වන්නේ,
i) කටුපුල්ලේවරු ලෙස ය.
ii) දිසාවේවරු ලෙස ය.
iii) කෝරළේවරු ලෙස ය.
iv) විදානේවරු ලෙස ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

24) පහත වගුවේ සටහන් කිහිපයක් (I) තීරුවේද, එම සටහන් වලට සම්බන්ධ රජවරුන් (II) තීරුවේද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. මුල්ලේරියාව සටන | A - සෙනරත් රජතුමා |
| 2. දන්තුරේ සටන | B - ii රාජසිංහ රජතුමා |
| 3. රන්දෙණිවල සටන | C - i රාජසිංහ රජතුමා |
| 4. ගන්නෝරුව සටන | D - i විමලධර්මසූරිය රජතුමා |

i) C,D,A, සහ B  ii) A,C,B සහ D  iii) D,B,C සහ A  iv) B,A,C සහ D

• පහත වගුවේ සඳහන් A සිට L දක්වා තොරතුරු ඇසුරෙන් 25, 26 සහ 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| රට | පුද්ගලයා | සොයාගැනීම |
|---|---|---|
| A - ඉතාලිය | E - ජොහැන්ස් ගුටන්බර්ග් | I - රෝග චිකිත්සක ක්‍රමය |
| B - ස්විස් ජාතික | F - අයිසෙක් නිව්ටන් | J - දුරදක්නය |
| C - ජර්මනිය | G - දෙ‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍‍ය පැරසල්සස් | K - ගුරුත්වාකර්ෂණ නියමය |
| D - එංගලන්තය | H - ගැලීලියෝ ගැලීලි | L - මුද්‍රණ යන්ත්‍රය |

25) මුද්‍රණ යන්ත්‍රය නිපදවීමට අදාල වරණය තෝරන්න.
i) A,E සහ J  ii) B,G සහ K  iii) D,E සහ I  iv) C,E සහ L

26) ගැලීලියෝ ගැලීලි පිළිබඳව සඳහන් වරණය තෝරන්න.
i) B,G සහ L  ii) D,H සහ I  iii) A,H සහ J  iv) C,H සහ K

27) ගුරුත්වාකර්ෂණ නියමය සොයාගැනීමට අදාළ වරණය තෝරන්න.
i) A,E සහ L  ii) D,F සහ K  iii) C,G සහ K  iv) B,H සහ J

• පහත දැක්වෙන්නේ බ්‍රිතාන්‍ය සමයට අදාළ සිදුවීම් කිහිපයකි. එම තොරතුරු ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රොබට් ඇන්ඩෲස්ගේ පැමිණීම.

B - උඩරට රදල පන්තියට පහර වැදීම.

C - හියුබොයිඩ්ගේ පැමිණීම.

D - රජෙකු නැතිවීම පිළිබඳ පසුතැවිල්ල

E - ව්‍යවස්ථාදායක සභාවේ මුල් වරට නිල නොලත් බහුතරය ඇතිවීම.

F - පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වාදීම.

28) 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ලක්‍ෂණ වනුයේ,
i) E සහ A  ii) A සහ B  iii) E සහ F  iv) F සහ D

29) 1818 ඌව වෙල්ලස්ස සටනට තුඩු දුන් හේතු ඇතුළත් පිළිතුර වනුයේ,
i) B සහ F  ii) D සහ E  iii) D සහ C  iv) B සහ D

30) රාජාධි රාජසිංහ රජුගේ කාලයේ උඩරටට පැමිණි දූතයින් දෙදෙනෙක් වනුයේ,
i) A සහ E  ii) A සහ C  iii) B සහ E  iv) C සහ D

• පහත වගුවේ සඳහන් A සිට J දක්වා තොරතුරු ඇසුරෙන් 31 සහ 32 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| වර්ෂය | පුද්ගලයා | වැදගත්කම |
|---|---|---|
| A - 1873 | D - පොන්නම්බලම් රාමනාදන් මහතා | G- ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති |
| B - 1910 | E - පොන්නම්බලම් අරුණාචලම් මහතා | H - පානදුර වාදය |
| C - 1919 | F - පූජ්‍ය මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | I - ප්‍රථම උගත් ලාංකික මන්ත්‍රීවරයා |

31) ලංකා ජාතික සංගමය පිහිටුවීම පිළිබඳ තොරතුරු ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
i) C,E සහ G  ii) A,F සහ H  iii) B,D සහ I  iv) C,F සහ G



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers  Model Answers • Study Resources

32) කෘෂි - මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ පිළිතුර ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
i) B,E සහ G ii) A,F සහ H iii) B,D සහ I iv) A,F සහ G

• පහත වගුවේ සඳහන් A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. ඒ එක් එක් ප්‍රකාශ යුගලයෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර 33 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - 1. ප්‍රවාහන ක්ෂේත්‍රය
2. මැකඩම් ක්‍රමය

B - 1. ඕල්කට්තුමාගේ ආගමනය
2. පානදුර වාදය

C - 1. සත්ත්ව අභිජනනය
2. බලු බද්ද

D - 1. පොපි මල් ව්‍යාපාරය
2. සූරිය මල් ව්‍යාපාරය

33) පළමුවැන්න දියුණුවීමට දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය කුමක්ද?
i) A ii) B iii) C iv) D

34) දෙවැන්න නිසා පළමුවැන්න සිදුවූ බව දැක්වෙන යුගලය කුමක්ද?
i) A ii) B iii) C iv) D

35) පළමුවැන්න සහ දෙවැන්න අතර කිසිදු සම්බන්ධතාවයක් නොදක්වන පද යුගලය කුමක්ද?
i) A ii) B iii) C iv) D

36) පහත වගුවේ වතුබෝග කිහිපයක් I තීරුවේ ද, එම වතු බෝග දියුණු කිරීමට පිහිටුවන ලද පර්යේෂණ ආයතන II තීරුවේද දැක්වේ. I තීරුව අනුව II තීරුව නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. තේ | A - අගලවත්ත |
| 2. පොල් | B - තලවකැලේ |
| 3. රබර් | C - ලුණුවිල |

i) A,B සහ C ii) B,C සහ A iii) A,C සහ B iv) C,A සහ B

37) කාර්මික විප්ලව සමයේ ඉඩම් කොටු කිරීමේ ව්‍යාපාරය මඟින් සිදුවූයේ,
i) විශාල ඉඩම් කුඩා කොටස් වලට වෙන් කිරීම යි.
ii) දිළින්දන් සතු ඉඩම් රදලයන් විසින් අත්පත්කරගැනීම යි.
iii) ග්‍රාමීය ඉඩම්වල කර්මාන්ත පුර ඇති කිරීම යි.
iv) සුළු ගොවීන් සතු කුඩා ඉඩම් එකතු කර විශාල ගොවිපළවල් සකස් කිරීම යි.

38) පහත සඳහන් සිදුවීම් සම්බන්ධ කාලයට අනුව නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,
A - ද්විත්ව පාලනය
B - මියුරන් කොමිසම ලංකාවට පැමිණීම.
C - කිව් ලිපිය ලන්දේසි ආණ්ඩුකාරවරයා වෙත එවීම.
D - උඩරට ගිවිසුම අත්සන් කිරීම.

i) C,B,A සහ D ii) A,B,C සහ D iii) D,B,C සහ Aiv) B,A,D සහ C

39) 1848 විරෝධතාව හේතුවෙන් මුළුමනින්ම අවලංගු කළ බදු වර්ග - වර්ගය වන්නේ,
i) ඔරු බද්ද / බලු බද්ද
ii) වෙළඳසැල් බද්ද / බලු බද්ද
iii) කරත්ත බද්ද
iv) මුද්දර බද්ද / ඇඟ බද්ද

40) මෙරට පැරණිතම දේශපාලන පක්ෂය ලෙස පිළිගනු ලබන්නේ,
i) ලංකා සමසමාජ පක්ෂය
ii) කම්කරු පක්ෂය
iii) එක්සත් ජාතික පක්ෂය
iv) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය

* * * *



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 33 S II |
|---|---|---|
| නම: ........................................ | ඉතිහාසය | කාලය පැය තුනයි |

උපදෙස් :
- I කොටසෙහි පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකටද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කරන්න.

i) කල්පිටිය, කලා ඔය, මාදුරු ඔය ජලාශය, හුරුළු වැව, සෙංකඩගල, ලංකා පටුන, ඌරාතොට, මඩකලපුව, කොළඹ, බුත්දල, සීගිරිය, මහියංගණය (ල.12)

ii) කළු මුහුද, කැලිකට්, ඉතාලිය, මලක්කා සමුද්‍ර සන්ධිය, කොරියානු අර්ධද්වීපය, පර්සියන් බොක්ක (ල.06)

(ආ) i) පහත A,B,C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙලින් ලියා දක්වන්න.


A - ක්‍රි.පූ. 250 තරම් ඈත අතීතයේ නගරයේ වාස්තු විද්‍යාත්මක ශිල්පියා හඳුන්වා ඇති නාමය කුමක්ද?

B - ශ්‍රී ලංකාවට පැමිණි මුල්ම පෘතුග්‍රීසි ජාතිකයා කවුරුන්ද?

C - 1848 නිදහස් සටනේ ප්‍රධාන මධ්‍යස්ථානය කුමක්ද?

D - වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීමට මැදිහත්වූ පුද්ගලයා කවුරුන්ද? (ල.4)

ii) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න.



1. A රූපයේ දැක්වෙන්නේ කුමක්ද?
2. මෙය ලියවන ලද රජතුමා කවුද?
3. මෙම ප්‍රදානය කරන ලද්දේ කවුරුන් හටද?
4. මෙම අභිලේඛණය අයත් මාධ්‍යය කුමක්ද?

A රූපය (ල.4)



1. B රූපයෙන් දැක්වෙන්නේ කවුරුන්ද?
2. ඔහු රජවීමට පෙර හැඳින්වූ නාමය කුමක්ද?
3. ඔහු අයත් රාජ වංශය කුමක්ද?
4. මොහු දළදා මාළිගාවට එකතු කරන ලද අලංකාරවත් නිර්මාණය කුමක්ද?

B රූපය (ල.4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources
iexamhub
PAST PAPERS WIKI

## II කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ වෙරළබඩ එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න. (ල.3)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාරයට ගත් ශාකමය කොටස් දෙකක හා මාංශමය කොටස් දෙකක නම් ලියන්න. (ල.4)

(iii) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙන් කොට හඳුනාගත හැකි ආකාරය කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.5)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ස්වරූපය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.6)

(03) (i) පූර්ව රාජ්‍ය සමයේ සිටි පහත නිලධාරීන් ශිලා ලේඛනවල හඳුන්වා ඇති නාමයන් මොනවාද?

A - පවුලේ ප්‍රධානියා

B - ගමේ ප්‍රධානියා

C - වැව්ගම් පද්ධතියේ ප්‍රධානියා (ල.3)

(ii) පහත දැක්වෙන පාලකයන්ට ආරෝපණය වී ඇති රාජ්‍යත්ව සංකල්ප වරහන් තුළින් තෝරා ලියන්න.

A - කූටකණ්ණ අභය රජතුමා

B - මහසෙන් රජතුමා

C - කාශ්‍යප රජතුමා

D - නිශ්ශංකමල්ල රජතුමා

(නරේශ්වර, කාලිංග චක්‍රවර්තී, මින්නේරි දෙවියන්, බෝධිසත්ත්ව, පර්වතරාජ) (ල.4)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු දෙකක් යටතේ විස්තර කරන්න. (ල.5)

(iv) ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තුළ දියුණු වෙළෙඳාමක් පැවති බවට නිදසුන් තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ල.6)

(04) (i) පූර්ව ඓතිහාසික යුගයේ විද්‍යාත්මක අදහස්වල ස්වරූපය පිළිබිඹු වන අවස්ථා තුනක් නම් කරන්න.(ල.3)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

A - වෙර බලය යොදා ගල්පතුරු ගලවා මෙවලම් තැනීම.

B - ක්‍රි.ව. දෙවන සියවසට අයත් ශිලා ලිපිවල ඇළ මාර්ග ඉදිකිරීමට සම්බන්ධ නිලධාරියා

C - වියළි කලාපීය ප්‍රදේශවල පානීය ජලයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීමට ඉදිකළ ළිං

D - රුවන්වැලි සෑය අකුණු වලින් ආරක්ෂා කරගැනීම සඳහා ඉදිකළ අංගය

(අළකොල වැව, අධික, වජ්‍ර චුම්බටය, බතගු, ඌරාකැට ළිං, පීඩන ශල්කනය) (ල.4)

(iii) පුරාණ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ස්ථාන දෙකක් නම් කර එහි යකඩ නිස්සාරණය සිදුකළ ආකාරය පැහැදිලි කරන්න. (ල.5)

(iv) පැරණි සමාජයේ පාලකයන් පරිසරය ආරක්ෂා කරගැනීමට ගත් ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න.(ල.6)

(05) (i) මහනුවර රාජධානිය හැඳින්වූ වෙනත් නම් තුනක් ලියන්න. (ල.3)

(ii) මහනුවර රාජධානි සමයේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් හතරක් නම් කරන්න. (ල.4)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා රාජ්‍යත්වය තහවුරු කරගැනීම සඳහා ගත් ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ල.5)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානය තුළ පැවති ලක්ෂණ තුනක් විස්තර කරන්න. (ල.6)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

(06) (i) බ්‍රිතාන්‍ය ජාතිකයින් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ යටත්කරගැනීමට පෙර මෙරටට පැමිණි ඔවුන්ගේ දූතයන් තිදෙනෙකු නම් කරන්න. (ල.3)

(ii) මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් නම් කරන්න. (ල.4)

(iii) 1803 උඩරට ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල.5)

(iv) 1818 ඌව වෙල්ලස්ස සටනට තුඩුදුන් හේතු තුනක් විස්තර කරන්න. (ල.6)

(07) (i) බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙරට ක්‍රියාත්මක වූ මිෂනාරි සංවිධාන තුනක් නම් කරන්න. (ල.3)

(ii) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමාගෙන් සිදුවූ සේවාවන් හතරක් නම් කරන්න. . (ල.4)

(iii) 1833 කෝල්බෲක් කොමිසම විසින් ඉදිරිපත් කළ නිර්දේශ දෙකක් පැහැදිලි කරන්න. (ල.5)

(iv) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ල.6)

* * *

## III කොටස

(08) (i) පුනරුද සමයේ සාහිත්‍යමය වශයෙන් සේවයක් කළ ගත් කතුවරයන් තිදෙනෙකු නම් කරන්න. (ල.3)

(ii) පුනරුද සමය ඇතිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල.4)

(iii) පුනරුද සමයේ විද්‍යාත්මක දියුණුවට බලපෑ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ල.5)

(iv) පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ල.6)

(09) (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය වර්ධනය වූ ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් නම් කරන්න. (ල.3)

(ii) ගල් අඟුරු කර්මාන්තයේ අතුරු ප්‍රතිඵල හතරක් නම් කරන්න. (ල.4)

(iii) කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ වෙනත් ක්ෂේත්‍ර දෙකක් නම් කර විස්තර කරන්න. (ල.5)

(iv) කාර්මික විප්ලවය සමාජ ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.6)

* * *




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources





iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

| 11 ශ්‍රේණිය | ඉතිහාසය | පිළිතුරු පත්‍රය |
|---|---|---|

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01) 3 | 02)4 | 03)4 | 04)1 | 05)2 | 06)3 | 07)2 | 08)3 |
| 09) 1 | 10)4 | 11)1 | 12)3 | 13)2 | 14)4 | 15)3 | 16)1 |
| 17) 1 | 18)3 | 19)4 | 20)2 | 21)2 | 22)3 | 23)1 | 24)1 |
| 25) 4 | 26)3 | 27)2 | 28)3 | 29)4 | 30)2 | 31)1 | 32)3 |
| 33) 1 | 34)2 | 35)3 | 36)2 | 37)4 | 38)1 | 39)2 | 40)1 |

## II කොටස

(02) (i) මිනිහා ගල්කන්ද, පතිරාජවෙල, බූන්දල

(ii) ශාකමය ආහාර - වල්දෙල්, කැලෑ කෙසෙල් (පෙළපොතේ 15 පිටුව)
මාංශමය ආහාර - ගවරා, කුලු මී හරකා, ගෝනා, දඬුලේනා, (පෙළපොතේ 15 පිටුව)

(iii) පිළිස්සුනු මැටි වළං භාවිතය, ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි භාවිතය, කෘෂිකර්මාන්තය ඇරඹීම, ස්ථාවර ජනාවාස ඉදිකිරීම, ආහාරණ සැකසීමේ තාක්ෂණය භාවිතය (පෙළපොත 19 පිටුව අනුව ලකුණු දෙන්න)

(iv) වාරි ගම් සංස්කෘතිය, වෘත්තීන් පදනම් කරගත් ගම් ඉදිකිරීම,කාර්ය පදනම් කරගත් ගම් ඉදිකිරීම, ගංගාවක පිටාර නිම්නයට පිටතින් ගම් ඉදිකිරීම. (පෙළපොත 25 පිටුව අනුව විස්තරයට ලකුණු දෙන්න)

(03) (i) පවුලේ ප්‍රධානියා - ගෘහපති, ගමේ ප්‍රධානියා - ගමික, වැව්ගම් පද්ධතියක ප්‍රධානියා - පරුමක

(ii) කුටකණ්ණ අභය රජු - දේවත්ව/නර ඉසෙර
මහසෙන් රජු - මින්නේරි දෙවියන් /දේවත්ව
I වන කාශ්‍යප රජු - පර්වත රාජ සංකල්පය/කුවේර
නිශ්ශංක මල්ල රජු - කාලිංග චක්‍රවර්ති/චක්‍රවර්ති

(iii) ලම්භකරණ වංශයේ ආරම්භක පාලකයාවීම, බදු එකතු කිරීම විධිමත් කිරීම, මහවැව් තැනවීමේ ආරම්භකයා වීම,උමං ජලමාර්ග ක්‍රමයේ ආරම්භකයාවීම,රටේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම, අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවයන්ට මුහුණදීමට සාධනීය පියවර ගැනීම, බෞද්ධ වෙහෙරවිහාර ප්‍රතිසංස්කරණය, රටේ දේශීය ආදායම නගා සිටුවීමට පදනම සකස් කිරීම.

(iv) සීගිරියේ බටහිර ජල උද්‍යානයේ සෙල්ලිපි, "අබලවපර" නමින් සියඹලා වෙළෙන්දෙක් ගැන තොරතුරු හමුවීම., සුරනිමල නැමැත්තෙක් අනුරාධපුරයේ වෙළෙඳසැලකින් සුවඳවිලවුන් මිලදී ගත් බවට මූලාශ්‍රවල සඳහන්වීම., IV වන උදය රජුට අයත් හෝපිටිගමුව වෙළෙඳපොළෙහි පාලනය පිළිබඳව පිහිටවන ලද නීති නානා දේසිව, ස්ඤ්ඤයාර්, අයින්නුරුවර් යනුවෙන් හැඳින්වූ වෙළඳ සංවිධාන පැවතීම.
(පෙළපොත 51,53 පිටු)

(04) (i) මැටිවරූ ආකාරයේ පරණ සුසාන, නිවාස ඉදිකිරීමේ තාක්ෂණය, මැටි බඳුන් තැනීම.

(ii) A - පීඩන ගල්කතය B - අඩික C - ඖරාකැට ළිං D - වජ්‍රවුම්බටය

(iii) <u>සබරගමුව පළාතට අයත් බලංගොඩ සමනොළ වැව ප්‍රදේශයෙන් සොයාගත් යකඩ උඳුන්</u>
මෙම උඳුන් ස්වභාවික සුළං බලයෙන් ඇවිළීමට අවස්ථාව සලසා ඇත. එහිදී ගිණි ඇවිලීම සඳහා යකඩ මරං ගස් හා ලිමොනසයිඩ් සහ හෙමටයිඩ් යන ගල්වර්ග භාවිතා කර ඇත.
<u>සීගිරිය ප්‍රදේශයේ දෙහිගන ඇළකන්ද ප්‍රදේශය</u> - එහි යකඩ ගිණියම් කිරීමට මයින හමක් ආධාර තරගෙන ඇත.

(iv) iv වන මිහිඳු රජු අනුරාධපුර පුවරු ලිපියෙන් උස් ගොඩබිම්වල කැළෑ කැපීම තහනම් කිරීම,තුන්වනඋදය රජු බුද්ධන්නේහෙල ලිපියෙන් "වල්වල දඬුපත් නොකපනුඉසා ' යනුවෙන් සඳහන් කර තිබීම.
පස්වන කාශ්‍යප රජු කොණ්ඩවට්ටවාන් වැටි ලිපියෙන් ගස්කොළන් කළමනාකරණයේදී රජය විසින් පිහිටුවා තිබෙන නීතිරීති වලට අනුකූලව ක්‍රියාකල යුතු බව සඳහන් වීම. (පෙළ පොත 89 පිටුව බලන්න)

(05) (i) සෙංකඩගල,සිරිවද්දනපුර,කන්දේනුවර , කටුපුල්ලේ නුවර,උඩරට රාජධානිය , උඩරට

(ii) ඇතුල්පහරදීම, ඇතුන් ලවා පාගා මැරීම, දඩ ගැසීම, දඬුකඳේ ගැසීම. (පෙළපොත 113 පිටුව)

(iii) කුසුමාසන දේවිය විවාහ කරගැනීම, කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳගැනීම, විමලධර්මසූරිය නමින් බෞද්ධ නමක් ලබාගැනීම.දෙල්ගමුව විහාරයේ සඟවා තිබූ දන්තධාතූන් මහනුවරට වැඩමකරවීම.

(iv) රටේ සියලු ඉඩම්වල උරුමකරුවා රජු ලෙස පිළිගැනීම,ඉඩම් අයිතිය සහ ඉඩම්බුක්තිය පදනම්කරගෙන කොටස් කිහිපයකට බෙදීම, (උදා:ගබඩාගම්, නින්දගම්) මහනුවර සමාජයේ ග්‍රාමීය සමාජයක් පැවතීම.
(පෙළපොතේ පිටුව 115)


www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources iexamhub

(06) (i) ජෝන් පයිබස්, හියුස් බොයිඩ්, රොබට් ඇන්ඩෲස්

(ii) බදු එකතු කිරීමට යොදවා සිටි නිලධාරීන් ආපසු යවා ඒ සඳහා දේශීය නිලධාරීන් යොදවා ගැනීම, පොල්ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත්කිරීම, ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත්කිරීම, ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම.

(iii) උඩරට ස්වභාවික රැකවරණය, ලෙඩරෝග පැතිරයාම, පහතරට සිට උඩරටට තිබූ සැපයුම් මාර්ග අවහිර වීම, කොළඹ සමග පණිවිඩ හුවමාරුව දුෂ්කරවීම, උඩරටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රම.

(iv) නිදහස අහිමිවීම හා රජෙකු නැතිවීම පිළිබඳ වූ පසුතැවිල්ල, ආගම හා සංස්කෘතිය ආරක්ෂාවීම පිළිබඳව ගැටළු මතුවීම, උඩරට ප්‍රභූ පැළැන්තියට පහරදීම, (පෙළපොතේ 34,35,36 පිටු)

(07) (i) ලන්ඩන්/ බැප්ටිස් /වෙස්ලියන් / ඇමෙරිකන් / චර්ච්

(ii) ඉරුදින දහම්පාසල් ආරම්භ කිරීම, වෙසක් පොහොය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත්කිරීම, බෞද්ධ කොඩිය නිර්මාණය, බෞද්ධ පාසල් ආරම්භ කිරීමට මූලිකත්වය ගැනීම, පරමවිඥානාර්ථ සමාගම පිහිටුවීම, බෞද්ධ පාසල් අරමුදල් පිහිටුවීම.

(iii) ව්‍යවස්ථාදායක සහ විධායක සභා පිහිටුවීම, උඩරට හා පහතරට ඒකාබද්ධ වූ පාලන ක්‍රමයක් හඳුන්වාදීම, දිවයින පළාත් පහකට බෙදීම, අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම, රජයෙ වෙළඳ ඒකාධිකාරිය අහෝසි කිරීම, ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු කිරීම.

(iv) සර්වජන ඡන්ද බලය, රාජ්‍ය මන්ත්‍රණ සභාව, විධායක කාරක සභා ක්‍රමය , රාජ්‍ය නිලධාරීන් සහ ආණ්ඩුකාරවරයා.

(08) (i) ඩාන්ටේ/තෝමස් මුවර්/ පෙට්රාක් /ප්‍රැන්සිස් බ්‍රේකන් /බොකාෂියෝ / විලියම් ෂේක්ස්පියර්

(ii) කොන්ස්තන්තිනෝපලය තුර්කිය යටතට පත්වීම, වෙළදාම දියුණුවීම, බුද්ධි ප්‍රබෝධය

(iii) විශ්වය පිළිබඳව ඉදිරිපත් වූ නව මත, වෛද්‍ය විද්‍යාවේ දියුණුව. (පෙළපොතේ 120,121 පිටු බලන්න)

(iv) **දේශපාලන වෙනස්කම් :** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය, නව නිළධාරී පන්තියක් හා පරිපාලන ආයතන පද්ධතික් බිහිවීම, යුරෝපීය නිති මූලධර්ම වලට අනුව නීතිරීති පද්ධතිය ආරම්භය, යුක්තිය සිදලීමේ අධිකරණ පද්ධතියේ ආරම්භය
**ආර්ථික වෙනස්කම් :** වාණිජ ආර්ථික රටාවකට හුරුවීම, ආනයන අපනයන ආරම්භය, මුදල් භාවිතය ප්‍රචලිත වීම,දුම්රිය මාර්ග හා මහා මාර්ග
**සමාජ සංස්කෘතික වෙනස්කම් :** මුද්‍රණ කර්මාන්තය ලංකාවට හඳුන්වාදීම, සමාජයේ දැනුවත්භාවය ඉහළයාම, ලාංකිකයින් යුරෝපා රටවලට ගොස් අධ්‍යාපනය ලබාගැනීම, බටහිර අධ්‍යාපන ක්‍රමය මෙරට ප්‍රචලිතවීම.

(09) (i) ගල් අඟුරු, පේෂ කර්මාන්තය, යකඩ හා වානේ කර්මාන්තය

(ii) සුවඳ විලවුන් / සායම් / පොහොර / ඖෂධ

(iii) ප්‍රවාහන ක්ෂේත්‍රය/ සන්නිවේදනය / කෘෂිකර්මාන්තය (පෙළ පොතේ පිටු අංක 7,8,9,10 බලන්න)

(iv) විශාල වශයෙන් නගර බිහිවීම සහ ඒවායේ වාසය කළ ජනතාවගේ ජීවන තත්ත්වයේ පුළුල් වෙනසක් ඇතිවීම, කර්මාන්ත ශාලා නිසා රැකියා අවස්ථා බිහිවීම, යුරෝපා රටවල නගර ඔරොත්තු නොදෙන තරමට ජනාකීර්ණ වීම, නාගරීකරණය වේගවත් වීම, පන්ති සහිත සමාජයක් බිහිවීම.
(පෙළ පොතේ පිටු අංක 15,16 බලන්න)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub